ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | **පුරවැසි අධ්‍යාපනය II** | කාලය : පැය 02 යි |
|---|---|---|

**සැලකිය යුතුයි**

i. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
ii. පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 ක් ඇතුලුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

01. i. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු 02 ක් නම් කරන්න.
ii. ඒකීය ආණ්ඩුක්‍රම ක්‍රියාත්මක වන රාජ්‍යයන් 02 ක් නම් කරන්න.
iii. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපෑ එක් සාධකයකි විවිධ ජාතීන් වෙළඳාමේ පැමිණීම. එසේ පැමිණි ජාතිකයින් 02 ක් නම් කරන්න.
iv. නිෂ්පාදනය සඳහා යොදාගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම දෙක නම් කරන්න.
v. රටවල් අතර පවත්නා ගැටුම් අන්තර්ජාතික ගැටුම් ලෙස හඳුන්වයි. මෙම ගැටුම් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වයි. එම කොටස් දෙක ලියන්න.
vi. නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව කොටස් දෙකකට බෙදේ. එම කොටස් දෙක නම් කරන්න.
vii. අතීතයේ මධ්‍යම පාලනය හැරුණු විට රජුගේ පාලන කටයුතු පහසුවීම සඳහා ප්‍රාදේශීය පාලන ඒකක 04 ක් දක්නට ලැබුණි. ඉන් 02 ක් නම් කරන්න.
viii. අයිතිවාසිකම් හා බැඳුණු පුරවැසි යුතුකම් දෙයාකාරයකට වර්ග කෙරේ. එම ආකාර දෙක නම් කරන්න.
xi. වායු දූෂණය වන ස්වභාවික ක්‍රම දෙකක් ලියන්න.
x. මැදිහත්කරුවෙකු තුළ පැවතිය යුතු ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 2x10=20)

02. i. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් මාධ්‍ය මගින් ඉටුකල යුතු කාර්යන් දෙකක් නම් කරන්න. (ල. 2)
ii. මධ්‍යම පළාතට අයත් දිස්ත්‍රික්ක 03 නම් කරන්න. (ල. 3)
iii. රාජ්‍යයක මූලික ලක්ෂණ 03 ක් නම්කර ඒ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 5)

03. i. වර්තමානයේ ක්‍රියාත්මක වන නව ලිබරල්වාදී වෙළඳපොළ ආර්ථික ක්‍රමයක මූලික ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 2)
ii. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක 03 ක් නම් කරන්න.(ල. 3)
iii. ශ්‍රී ලංකාවේ දක්නට ඇති ජනවර්ග දෙකක් නම්කර මෙරට බහුසංස්කෘතික සමාජයක් පවත්නා බව සනාථ කරන්න. (ල. 5)

04. i. පළාත් පාලන ආයතන 02 ක් නම් කරන්න. (ල. 2)
ii. නූතන රාජ්‍යවල බලය බෙදාහැරීමට බලපෑ හේතු 03 ක් නම් කරන්න. (ල. 3)
iii. සංඝීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතුය ගුණාංග 03 ක් නම් කර කෙටියෙන් පහදන්න. (ල. 5)

05. i. 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පසු මෙරට ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් දෙකක් නම් කරන්න. (ල. 2)
ii. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ 03 ක් නම් කරන්න. (ල. 3)
iii. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් නවාංගයන් 03 ක් නම්කර කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

06. i. ස්වභාවික සංසිද්ධීන් ඇසුරින් භෞතික පරිසරයට සිදුවන හානි දෙකක් නම් කරන්න. (ල. 2)
ii. සමාජ පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන ප්‍රතිඵල 03 ක් නම් කරන්න. (ල. 3)
iii. රටක් සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු සඳහා ගතහැකි විසඳුම් 03 ක් නම්කර ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

07. i. ජාත්‍යන්තර වෙළඳාම තුළ භාවිත වන ප්‍රබල මුදල් ඒකක දෙකක් නම් කරන්න. (ල. 2)
ii. විදේශ ආධාර සපයන ආකාර 03 කි. එය නම් කරන්න. (ල. 3)
iii. ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීමෙහිලා බලපා ඇති සාධක 03 ක් නම් කර දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

www.edudept.up.gov.lk